1978 . 7 . 20

# ජාතික රාජ්‍ය සභාවේ
# 1978 අංක 25 දරන මහජන බැංකු
# (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූලි මස 07 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 30 යි

තැපැල් ගාස්තුව : ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 25 දරන මහජන බැංකු (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 27/78

**මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ධුරය දරමින් සිටි මහජන බැංකුවේ අධ්‍යක්ෂවරයන් පිළිබඳව විධිවිධාන සැලැස්වීම පිණිස සහ 1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 25 දරන මහජන බැංකු (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මේ පනත ආරම්භ වන දිනට ඉහතින් ම වූ දිනයෙහි මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරයකු ලෙස ධුරය දරන සෑම තැනැත්තකු ම, එම තැනැත්තා එම ධුරයට පත් කරනු ලැබුව ද, නැතහොත් තෝරා පත් කරගනු ලැබුව ද, නැතහොත් 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයෙහි විධිවිධාන ප්‍රකාර එම තනතුර දැරුව ද, එකී පනතෙහි කුමක් සඳහන් වුව ද, මේ පනත ආරම්භ වන දිනයෙහි එම ධුරය දැරීම අවසන් කළ යුතු ය. මේ පනත ආරම්භ වන දිනට ඉහතින් වූ දිනයෙහි ධුර දරමින් සිටි මහජන බැංකුවේ අධ්‍යක්ෂවරයන් මේ පනත ආරම්භ වන දිනයෙහි ඒ බර දැරීම අවසන් කළ යුතු බව.

මේ වගන්තියෙහි "මහජන බැංකුව" යන්නෙන් 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් පිහිටුවන ලද මහජන බැංකුව අදහස් වේ.

3. 1961 අංක 29 දරන මහජන බැංකු පනත පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ සංශෝධන.

(අ) ඒ පනතේ 8 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන්:—

"අධ්‍යක්ෂ මණ්ඩලය.

8. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයන් අට දෙනකුගෙන් මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) යම් තැනැත්තකු—

(අ) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි බලපවත්වන යම් නීතියක් යටතේ සිහිවිකල් බවට තීරණය කොට හෝ ප්‍රකාශ කොට ඇත් නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක බල පවත්වන යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට හෝ බුන්වත් බවට පත් තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබ, නිදහස් කරනු නොලැබූ, වස්තු භංගත්වයට නැතහොත් බුන්වත් බවට පත් තැනැත්තකු නම්; හෝ

(ඇ) චරිත දූෂණයකට සම්බන්ධ වූ ද හය මාස යකට නොඅඩු කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් පැමිණවිය හැකි වූ ද වරදකට වරදකරු කරනු ලැබ ඇත් නම්; හෝ

(ඉ) මෙම බැංකුව නොවන වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු නම්

ඔහු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම සඳහා හෝ එසේ තවදුරටත් කටයුතු කිරීම සඳහා හෝ නුසුදුසු විය යුතු ය.

(3) අමාත්‍යවරයා වෙත ඉල්ලා අස්වීමේ ලිපියක් යැවීමෙන් යම් අධ්‍යක්ෂවරයකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) ඉවත් කිරීම සඳහා හේතු නොදක්වා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යම් අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. තව ද එවැනි ඉවත් කිරීමක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ නියම යක් කරනු ලැබුවේ යම් අධ්‍යක්ෂවරයකු සම්බන්ධ යෙන් ද, ඒ අධ්‍යක්ෂවරයා, ගැසට් පත්‍රයෙහි ඒ නියමය පළ කරනු ලැබූ දිනයෙහි, ධුරය හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධි විධානවලට යටත් ව, අධ්‍යක්ෂවරයකු ධුරයට පත් කරනු ලැබූ දිනයෙහි සිට අවුරුදු තුනක කාලයක් සඳහා ඔහු ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද මිය ගිය හෝ ඉල්ලා අස් වූ හෝ අන් ලෙසකින් ධුරය හිස් කළ අධ්‍යක්ෂවරයකු වෙනුවට පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු කලින් ධුරය හිස් කරතහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(6) යම් අධ්‍යක්ෂවරයකුට අසනීපයක් නිසා හෝ අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයෙහි කටයුතු ඉටු කිරීමට තාවකාලික ව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් අධ්‍යක්ෂවරයා ලෙස වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(7) (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු නොවන යම් අධ්‍යක්ෂවරයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(8) සියලුම අධ්‍යක්ෂවරයන්ට හෝ ඔවුන්ගෙන් කිසිවකුට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක පාරිශ්‍රමිකයක් බැංකුවේ මුදල් වලින් ගෙවනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය පස් දෙනකු විය යුතු ය.

(10) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින්, එම මණ්ඩලයේ රැස් වීම් සහ එම රැස්වීම්වල කටයුතු කර ගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකි ය.

(11) අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසා පමණක් මණ්ඩලයෙහි යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු නොවිය යුතු ය.";

(ආ) ඒ පනතේ 9 වන වගන්තියෙහි (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(ඇ) ඒ පනතේ 10 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :—

"මණ්ඩලයේ සභාපති.

10. (1) අධ්‍යක්ෂවරයන් අතුරෙන් අමාත්‍ය වරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයාට අසනීපයක් නිසා හෝ අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත්, ඔහු වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) කිසිම හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයාගේ පත්වීම අවසන් කළ හැකි අතර, එසේ අවසන් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත ඉල්ලා අස්වීමේ ලිපියක් යැවීමෙන් යම් අධ්‍යක්ෂවරයකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ සභාපතිවරයා ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ සභාපති ධුරය කලින් හිස් කරතහොත් මිස, ඔහු අධ්‍යක්ෂවරයකුව සිටින තාක් කල් ඒ ධුරය දැරිය යුතු ය.".